පුරවැසි මාධ්‍යකරුවකුගේ සටහන්
200702225

# මංගලගේ සටන

*ආණ්ඩුවේ විදේශ කටයුතු ඇමැතිවරයා සහ දෙවන දේශපාලන නායකයා විධායක බලය මගින් එකවරම ධුරයෙන් ඉවත් කරනු ලබයි.*

*ඇමැති ධුරයෙන් ඉවත් කිරීම සාධාරණීයකිරීමට පවත්වනු ලබන ප්‍රසිද්ධ කතාවෙහිදී විධායක ජනාධිපතිවරයා හිටපු ඇමැතිවරයා ඇතුළු පිරිස කුමන්ත්‍රනකාරීන් බවත්. තෙමසක් තුළ තමාගේ මරණය ඔවුන් විසින් පුරෝකථනය කර ඇති බවත් එල්ටීටීඊ සංවිධානය සමග හවුලක සිටින බවටත් චෝදනා කරයි.*

*ඒ සමගම වාගේ එල්ටීටීඊ මරණ ලැයිස්තුවේ ඉහලින් ම සිටින හිටපු ඇමැතිවරයාට සපයා තිබූ රාජ්‍ය ආරක්ෂාව පැය 12ක් ඇතුළත ඉවත් කරයි.*

*හිටපු ඇමැතිවරයාගේ මැතිවරණ බල ප්‍රදේශයේ කාර්යාලයට කඩා වදින ආරක්ෂ අංශ පිරිස් එහි ඇත් පරිගනක යනාදි සියලුම උපකරණ රැගෙන යයි.*

*හිටපු ඇමැතිවරයා අගනුවර හෝටලයක පැවැත්වීමට නියමිත වු පුවත්පත් සාකච්ඡාව අහෝසි කිරිමට සිදුවෙයි.*

රටක මෙවැනි දේශපාලන වාතාවරණයක් ඇතිවන විට එය හදුන්වන්නේ කුමණ නමකින් ද?

X X X X X

එම තත්ත්වයට මුහුණ දුන් මංගල සමරවීර නම් හිටපු ඇමැතිවරයා ජනාධිපති මහින්ද රාජපක්ෂ වෙත ලියූ ඊට අදාළ ලිපිය ශ්‍රී ලංකාවේ ජනමාධ්‍ය විසින් තේරුම් ගැනීමට බැරි තරමට වාරණය කරන ලද නමුත් එය නොකිය වු අප සමාජය ගැන උනන්දුමත් පුරුවැසියකු සිටිය නොහැකි ය. එය වාරණය වු ප්‍රමාණයෙන්ම එම ලිපියේ එන එක් කරුණක් සනාථ වෙයි. එනම් අද මෙරට මාධ්‍ය නිදහස බිය ගැන්වී සිටින බවය.

ප්‍රවෘත්තිමය අගයේ සහ වානිජමය කෝණයෙන් කල්පනා කරන ඕනෑම ජනමාධ්‍යයක් එම ලිපිය සම්පූර්ණයෙන්ම නැතත් සාරංශයක් ලෙස හෝ පළ කළ යුතුව තිබුනි. පුවත්පත් පිටු පුරා පළ වන කමකට නැති ලිපි දෙස බලන විට මංගල සමරවීර මහතාගේ ලිපිය පළ නොවීමට හේතුව ස්වයං හෝ බාහිර වාරණයක් බව පැහැදිලි ය. එය යුද වාරණයක් නොවේ. දේශපාලන වාරණයකි.

අප මංගල සමරවීර මහතාගෙ ලිපිය කියවිය යුත්තේ එහි එන කරුණු පිලිගැනීමට නොවේ. විචාර බුද්ධියෙන් යුතුව සළකා බැලීම පිනිස ය. 1992 දී ලලිත් ඇතුළත්මුදලි සහ ගාමිණී දිසානායක මූලිකත්වයෙන් ගෙන ආ දෝශාභියෝග චෝදනා විසින් ඇති කළ දේශපාලන සංවාදය ශ්‍රී ලංකාවේ දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදී කිරීමෙහි වැදගත් සංධිස්ථානයක් සටහන් කලේ ය. එම දේශපාලනඥයින් දෙදෙනාගේ ඉතිහාසය සහ භූගෝලය ගැන කතා කරනවාට වඩා වැදගත් වූයේ ඔවුන් විසින් ඉදිරිපත් කල විවේචනයයි.

එම විවේචනයේ හරි මැද තිබුනේ විධායක ජනාධිපති ධුරයේ අනිටු විපාක ය. ඉන් පසු අද දක්වාම ශ්‍රී ලංකාවේ දේශපාලනයේ යටපත් කළ නොහැකි සාධකයක් වශයෙන් විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ අවශ්‍යතාවය පවතී.

සමහර විට මංගල සමරවීර ලිපියේ වැදගත්ම චෝදනාව වන්නේ රාජ්‍ය අයවැයෙන් සියයට 60ක් ද අමාත්‍යංශ පහක් ද රාජ්‍ය ආයතන 90ක් ද විධායක ජනාධිපති මහින්ද රාජපක්ෂ සහ ඔහුගේ සහෝදර සමාගම විසින් පාලනය කරන්නේ ය යන කරුන ය.

මෙම චෝදනාව සත්‍ය නම් එවැනි තත්ත්වයකට සහාය දීමට හෘද සාක්ෂියක් ඇති කිසිවකුට නොහැකි වනු ඇත. ලිපිය පළ කළ නොකළ සියළු ජනමාධ්‍ය වෙත පැවරී ඇති වැදගත් කාර්‍යයක් වන්නේ මෙම හෙලිදරව් කිරීම පිලිබඳව විධිමත් සාකච්චාවක් ගොඩ නැගීම යි. දැනුවත් පුරවැසියකු බිහි කිරීම ජනමාධයයේ එක් මූලික කාර්‍ය භාරයක් වන බැවිනි.

ඔහුගේ ලිපියෙන් මතුවන අනෙක් කරුන නම් අද මෙරට දේශපාලන සමාජය තුළ මහින්ද රාජපක්ෂ ජනාධිපති විවේචනය කිරීමට කොතරම් භීතියක් පවතින්නේ ද යන්න යි. මංගල සමරවීර මහතා සිය ලිපියෙහිම සඳහන් කරන්නේ මෙම හෙළිදරව්ව නිසා ඔහු මරා දැමීමට වුවද ඉඩ ඇති බව යි.

එමෙන්ම රටෙහි සිදුවන මානව හිමිකම් කෙළෙසීම් සම්බන්ධයෙන් ආණ්ඩුව නිහඬ පිලිවෙතක් අනුගමනය කරන බව ද එම ලිපියෙන් පිලි ගනී. එල්ටීටීඊ හංවඩුව ගසා විරුද්ධවාදීන් මර්ධනය කිරීම නතර කරන ලෙස ද ඒ මහතා සිය ලිපියෙන් කියා සිටී.

මෙම කරුනු හෙලිදරව් කරනු ලබන්නේ ආණ්ඩුවේ සිටි දෙවන දේශපාලන නායකයා සහ හිටපු විදේශ ඇමැති ය.

එම කරුණු හෙළිදරව් කරන්නට පෙරම ආණ්ඩුවේ සිටි දෙවන දේශපාලන නායකයා කුමංත්‍රණකරුවකු ලෙස හංවඩු ගැසීමත් එල්ටීටීඊ සහායකයකු ලෙස වක්‍ර ලෙස නම් කිරීමත් බිය ගැන්වීම පිනිස ඔහුට සපයා තිබූ ආරක්ෂාව ඉවත් කිරීමත් විසින් ලිපියේ එන අදාළ චෝදනා යම් දුරකට හෝ සනාථ වෙයි.

මහින්ද රාජපක්ෂ ජනාධිපතිවරයා සමඟ ගැටුමකට යාමට මංගල සමරවීර මහතාට මෙම ලිපියෙහි දක්වා ඇති කරුනු වලට අමතර දේශපාලන න්‍යාය පත්‍රයක් නොතිබුනේ යැයි අපට කීමට නොහැකි ය. දොෂාභියෝගකරුවන් වූ  ලලිත් සහ ගාමිණී ට ද එවැනි අනෙක් න්‍යාය පත්‍ර තිබුණි. එසේ නමුත් දේශපාලනය ප්‍රජාතන්ත්‍රවාදී කිරීමට දෝශාභියෝගය සහ ඉන් අනතුරුව ඇති වූ දේශපාලන පෙළ ගැසීම් මහත් දායකත්වයක් ලබා දුන් බව ප්‍රතික්ෂේප කළ නොහැකි ය.

මංගල සමරවීර මහතා මීට වඩා මැති ඇමැති පිරිසක් සමඟ එක්ව මෙම විවේචන ඉදිරිපත් කරනු ලැබුයේ නම් වඩා සාධනීය දේශපාලන සාකච්ජාවක් ගොඩ නැගෙන්නට ඉඩ තිබුනි. දැන් සිදු වන්නේ ශ්‍රී ලංකාවේ දේශපාලනයේ පිරිහීම පෙනුනුම් කරන ස්තෝත්‍ර ගායක වන්දි භට්ටයන් සහ ක්ෂමාලාපකයින් කළඑලි බැසීම යි. මෙරට දේශපාලනය තුළ හෘද සාක්ෂියේ හඬක් නැත.  ස්වාධීන තීරණයක් ගැනීමට කිසිදු දේශපානඥයකුට විධායක ජනාධිපති ධූරය ඉඩ දෙන්නේ නැත.

පසුගිය සතියේ තිසරණී ගුනසේකර සිය දේශපාලන විග්‍රහය තුළ කියා තිබුනේ ආණ්ඩුව තුළම පවතින මර්ධනකාරී තත්ත්වය නිසා විරුද්ධ මතධාරීන් නැතිව යන්නේ නැති බවත් සිදු වන්නේ ඔවුන් නිහඬවීම පමණක් බවත් ය. ඇය කියා සිටින්නේ මෙමගින් ආණ්ඩු විරෝධි තෙවැනි පෙරමුණක් මෙමගින් දකුනේ බිහිවන බව යි.

නමුත් මංගල සමරවිර මහතාගේ ලිපියෙහි විධායක ජනාධිපතිධූරය අහෝසි කළ යුතු බවට කිසිදු අදහසක් දක්වා නැත. වික්ටර් අයිවන් පෙන්වා දී තිබූ පරිදි මංගල සමරවිරගේ සිට විමල වීරවංශ හරහා රනිල් වික්‍රමසිංහ දක්වා සිටින විවිධාකාර දේශපාලනඥයෝ විධායක ජනාධිපති ධූරයේ පහසින් සන්තර්පණය වූ අය වෙති. තහනම් ගසෙහි ගෙඩි කෑ මේ සියල්ලන් බලා සිටියේ තමන්ට ද එකී බලය ලැබෙන තුරු විය හැකි ය.

නමුත් දැන් මේ සියල්ලන්ටම ඇති හොඳම තෝරා ගැනීම විය හැක්කේ විධායක ජනාධිපති ක්‍රමය වෙනුවට වඩා ප්‍රජාතන්ත්‍රවාදී විකල්පයන් සැළකිල්ලට ගැනීම යි. මංගල සමරවීරගේ ලිපියෙහි රොඩු බොඩු ඉවත්කර බලන විට පෙනී යන්නේ මෙම ලිපිය ද විධායක ජනාධිපති ක්‍රමයට එරෙහිව පැන නැගී දේශපාලන දෝශාභියෝගයක් බව යි. අපේ සාකච්ඡාව දැන් ගොඩ නැගිය යුත්තේ කේන්ද්‍රීය ප්‍රශ්නය වන විධායක ජනාධිපති ධුරයේ ඒකාධිපති ස්වභාවය සහ එයට ඇති විකල්ප වටා ය.

තමාගේ ප්‍රථම ධුර කාලයෙන් පසු විධායක ජනාධිපති ක්‍රමය සංසෝධනය කිරීමට පොරොන්දු වී ඇති මහින්ද රාජපක්ෂ මහතාද එවැනි සාකච්චජාවක කොටස්කරුවකු කර ගැනීම තවත් අභියෝගයකි.

බලන් ඉදිමුද? සාකච්ජාවක් ඇද ගනිමුද?

සුනන්ද දේශප්‍රිය